# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,445 - 2025 ජූලි මස 11 වැනි සිකුරාදා - 2025.07.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 146 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 අගෝස්තු මස 01 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජූලි මස 18 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජූනි මස 09 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

145 - B 082699 — 177 (2025/07)
C 1 -

# පිස්කල් විකිණීම

**කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය**

විකිණීමේ දැන්වීමයි

යූ. බී. ෆිනෑන්ස් පීඑල්සී, PQ 00783806)
(පෙර ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි කම්පැනි ලිමිටඩ් සහ නැවත යූ. බී. ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් වශයෙන් ද පසුව යූ. බී. කම්පැනි පීඑල්සී වශයෙන්ද හඳුන්වනු ලැබූ) අංක 10, ඩේසි විලා ඇවිනිව්, කොළඹ 04.

*...............පැමිණිලිකරු*

*එදිරිව*

01. රංජුල සමන්ති සිරිමාන්න
02. දොන් චින්තක ප්‍රසංග කුලතුංග,

*දෙදෙනාම*
අංක 55/18,
වීර මාවත, කළල්ගොඩ,
පන්නිපිටිය.

*............විත්තිකරුවන්.*

නඩු අංකය : CHC 59/17MR
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 7,860,766/-
කාර්ය පටිපාටිය : සාමාන්‍යය
ඇස්කිසි අංකය : 25/2023

මෙම නඩුවේ විකිණීමේ අධිකාරි පත්‍රය ක්‍රියාත්මක කරමින් තීන්දු ප්‍රකාශයේ සහ පැමිණිල්ලේ උපලේඛනගත දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා මෙම නඩුවේ වර්ෂ 2020.09.25 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව, 1 වන සහ 2 වන විත්තිකරුවන් විසින් පැමිණිලිකරුවන්ට ගෙවිය යුතු මුදල් සහ පොළී මුදල්වල සම්පූර්ණ එකතුව රුපියල් ලක්ෂ හතලිහ (රු. 4,000,000) මුදලක් පමණක් අයකර ගැනීම සඳහා, තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට, මා විසින් 2023 ක් වූ අගොස්තු මස 25 වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුවන්ට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

වර්ෂ **2025** ක් වූ අගෝස්තු මස **05** වැනි දින පෙ. ව. **10.30** ට

ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරලේ, උඩුගහපත්තුවේ, හෝමාගම ප්‍රාදේශීය සභා සීමාව තුළ, කිරිවත්තුඩුව ගමෙහි පිහිටි දේපළ වන **ගොඩපොරගහලන්ද සහ මඩිත්ත කනත්ත** නමැති බලයලත් මානක එම්. ඒ. ජයරත්න විසින් මැන සාදන ලද වර්ෂ 2000 ක් වූ නොවැම්බර් මස 10 වන දිනැති හා අංක 2998 දරන සැලැස්ම ප්‍රකාරව බෙදා වෙන්කළ කැබලි අංක 22 දරන ඉඩමට මායිම් : *උතුරට* : අංක 1534 දරන පිඹුරේ කැබලි අංක 1C සහ කැබලි අංක D 4 දරන කොටසද, *නැගෙනහිරට* : කැබලි අංක 25, 24 සහ 23 දරන කොටස් ද, *දකුණට* : කැබලි අංක R1, R2 සහ 21දරන කොටස් ද, *බස්නාහිරට* : කැබලි අංක D4 දරන කොටසටද යන මායිම් තුළ පර්චස් දාහතයි දශම දෙක (අ:0 රූ. 0 පර්. 17.2) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, පස ඇතුළු ගහකොළ, පළතුරු ආදී සියළු දේත් වේ. මෙම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 298/239 වෙළුම පත් ඉරුවෙහි ලියාපදිංචි වී ඇත. එම ඉඩමට එකී අංක 2998 දරන පිඹුරේ ලොට් අංක 27 (සුබසාධන කටයුතු සඳහා වෙන් කරන ලද හා ලොට් අංක R1, R2, හා R 3 ප්‍රවේශ මාර්ග අයිතිය) ලොට් අංක R4 ඇල R5 ඇල සඳහා වෙන් කිරීම සහ ලොට් අංක D1,D2, D3 හා D4 (ඇල) සම්බන්ධයෙන් වන පරවශාතා අයිතීන් ද සමගින් වේ.

**ගෙවීමේ ක්‍රමය :**

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

(01) වෙන්දේසිය අවසන් කළ වහාම ගැනුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.

(02) ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතුය.

(03) රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2025 ක් වූ ජුනි මස 24 වැනි දින දී ය.

---

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

**හලාවත දිසා අධිකරණයේ දී ය**

පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පීඑල්සී,
අංක 450, ගාලු පාර,
කොළඹ 03.

නඩු අංකය : MB 6215
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 1,715,193.32
පටිපාටිය : සාමාන්‍යය
ඇස්කීසි අංකය : 08/24

...............*පැමිණිලිකරු*

*එදිරිව*

01. රජතේව මොහොට්ටි අප්පුහාමිලාගේ අසේල ගයාන් මනුරංග
02. හේරත් හිටිහාමිලාගේ පුෂ්පලතා

*දෙදෙනාම*
අංක 143, කිරිවැල්කැලේ,
නල්ලදරන්කට්ටුව.

............*විත්තිකරුවන්.*

වර්ෂ 2022 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින හලාවත දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව පැමිණිලිකරුට ඉහත 1 වන සහ 2 වන විත්තිකරුවන්ගෙන් වර්ෂ 2018/05/08 දින වන විට අයකර ගැනීමට ඇති මුදල **රුපියල් දාහත් ලක්ෂ පහළොස් දහස් එකසිය අනූ තුනයි ශත තිස් දෙක (රු. 1,715,193.32)** ක් සහ වර්ෂ 2018 ක් වූ මැයි මස 09 වැනි දින සිට රු. 1,650,017.58 ක මුදල මත 18%ක පොළියද පැමිණිලිකරුට ගෙවන ලෙස තීන්දු කර ඇත.

තවද ඉහත පැමිණිලිකරුට 1 වන හා 2 වන විත්තිකරුවන්ගෙන්, **රුපියල් දාහත් ලක්ෂ පහළොස් දහස් එකසිය අනූ තුනයි ශත තිස් දෙක (රු. 1,715,193.32)** ක් සහ වර්ෂ 2018 ක් වූ මැයි මස 09 වැනි දින සිට රු. 1,650,017.58 ක මුදල මත 18% ක පොළිය ද, අයකර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද ප්‍රසිද්ධ නොතාරිස් සී. සිරිමෙවන් විජේසේකර විසින් වර්ෂ 2016 ක් වූ සැප්තැම්බර් මස 21 වැනි දින ලියා සහතික කරන ලද අංක 11706 දරන උකස් බැඳුම්කරයේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2025 ක් වූ අගෝස්තු මස 05 වැනි දින පෙ. ව. 11.00 ට**

මා විසින් තහනමට ගන්නා ලද අංක 592 සී ඉලක්කට්ටුව ග්‍රාම නිලධාරි වසමේ, කිරිවැල්කැලේ ගමෙහි පිහිටි, "කිරිවැල්කැලේ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් වර්ෂ 2010.10.05 සාදන ලද අංක 1059 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 දරන එම නිශ්චල දේපළ මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළේ පිහිටීම* .- හලාවත නගරයේ සිට පුත්තලම මාර්ගයේ කිලෝමීටර් 14 ක් පමණ ඉදිරියට ගොස්, නල්ලදරන්කට්ටුව හන්දිය දක්වා (කිලෝමීටර් 88 කණුව පසුකර මීටර් 300 ක් ) අත්තන්ගනේ මාර්ගයට දකුණට හැරී කිලෝමීටර 2 ක් පමණ ඉදිරියට ගිය පසු බෝගස සහ බුදු පිළිමය පසු කර, යන විට මාර්ගයේ වම් පසින් මෙම ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය :* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින්,

(අ) ගැණුම් මිලෙන් සියයට විසි පහක් ( 25%) ක් ද
(ආ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාර නියෝජ්‍ය පිස්කල්තැනගේ ගාස්තු ද,
(ඇ) විකුණුම් සඳහා වන සියලුම වියදම් මුදලින් ගෙවිය යුතුය. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) ක් වූ මුදල විකුණුම් දින සිට දින තිහක් (30) ඇතුළත එකී නඩුවෙහි බැරට අධිකරණයේ තැන්පත් කළ යුතුය.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, පිටිගල් උතුරු කෝරළේ, ආනවිලුන්දන් පත්තුවේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභා සීමාව තුළ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 592 සී ඉලක්කට්ටුව ග්‍රාම නිලධාරී වසමේ, කිරිවැල්කැලේ ගමෙහි පිහිටි "කිරිවැල්කැලේ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන රජයේ ඉඩමට සර්වෙයර් ජනරාල් විසින් සාදන ලද අංක P. P. Pu. 158 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 108 දරන කොටසට මායිම් :

උතුරට : වැරදිසහගත ලෙස කැබලි අංක 101 සහ 102 ලෙස සඳහන් ව ඇති නමුත් වඩාත් නිවැරදිව සර්වෙයර් ජනරාල්වරයා විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ සඳහන්ව ඇති පාරක් ලෙස ලකුණු කරන ලද කැබලි අංක 107 ද

නැගෙනහිරට : සර්වෙයර් ජනරාල්වරයා විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ සඳහන් පාරක් ලෙස ලකුණු කරන ලද කැබලි අංක 107 ද,

දකුණට : වැරදි සහගත ලෙස හිමිකම් ඔප්පුවේ අංක 107 ලෙස දක්වා ඇති නමුත් වඩාත් නිවැරදිව සර්වෙයර් ජනරාල් විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ කැබලි අංක 150 ද,

බස්නාහිරට : සර්වෙයර් ජනරාල්වරයා විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ කැබලි අංක 101 සහ 102 යන එකී මායිම් තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිස්පහක (අක්. 2 රූඩ් 3, පර්. 35) විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේද වේ.

මෙම ඉඩම හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු අංක B ආර 22/09 සහ 25/03 හි ලියාපදිංචි කර ඇත.

නව මැනුමකට අනුව ඉහත ඉඩම, පහත පරිදි විස්තර වේ :-

ඉහත කී කිරිවැල්කැලේ ගමෙහි පිහිටි "කිරිවැල්කැලේ වත්ත" යනුවෙන් හඳුන්වනු ලබන ඉඩම බලයලත් මිනින්දෝරු එම්. කේ. මංජු ශ්‍රී ප්‍රියංකර විසින් වර්ෂ 2010/10/05 සාදන ලද අංක 1059 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 01 දරන කොටසට මායිම්:

උතුරට : සර්වෙයර් ජනරාල්වරයා විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ පාරක් ලෙස ලකුණු කරන ලද කැබලි අංක 107 ද,

නැගෙනහිරට : සර්වෙයර් ජනරාල්වරයා විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ සඳහන් පාරක් ලෙස ලකුණු කරන ලද කැබලි අංක 107 ද,

දකුණට : සර්වෙයර් ජනරාල්වරයා විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ ප්‍රාදේශීය සභා පාර ලෙස ලකුණු කරන ලද කැබලි අංක 150 ද

බස්නාහිරට : සර්වෙයර් ජනරාල් විසින් සාදන ලද P. P. Pu. 158 දරන පිඹුරේ කැබලි අංක 101 සහ 102 යන එකී මායිම් තුළ පිහිටි අක්කර දෙකයි රූඩ් තුනයි පර්චස් තිස්පහ (අක්. 2 රූඩ් 3, පර්. 35) විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේද වේ.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
හලාවත.

වර්ෂ 2025 ක් වූ ජුනි මස 05 වැනි දී ය.

07-619

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.